## තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

### ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2015



**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2015

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**
**තැ.පෙ.14, පේරාදෙණිය**

# පටුන


| | |
|---|---|
| 1. හැඳින්වීම | 01 |
| 2. 2015 වසරේදී ලැබූ ප්‍රගතිය | 08 |
| 3. ආදායම | 10 |
| 4. මූල්‍ය වැය ප්‍රගතිය | 11 |
| 5. 2015 දී උද්භිද උද්‍යානයන් හි සිදුවන සංවර්ධන වැඩසටහන් හි භෞතික ප්‍රගතිය | 16 |
| 6. දෙපාර්තමේන්තුව යටතේ සෙසු ඒකකවල කළමනාකරණය | 28 |
| 7. 2015 වර්ෂය තුළ සිදු කරන ලද අභ්‍යන්තර ස්ථානමාරු, වැටුප් වර්ධක, හා වෙනත් කටයුතු | 30 |
| 8. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම | 31 |
| 9. 2016 වර්ෂය සඳහා අනාගත සැලැස්ම | 32 |

## 01. හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධ ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනය වේ. එය ශාක විතැන් සංරක්ෂණය, ශාක පිළිබඳ අධ්‍යාපන කටයුතු, ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන්, මල් වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන අතර දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආකර්ශනීය ස්ථානයක් ද වේ.

බ්‍රිතාන්‍ය සමයේ ආරම්භ කරන ලද ප්‍රධාන උද්භිද උද්‍යාන වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ 1950 ගණන් වල ආරම්භ කරන ලද ගනේවත්ත වන ඖෂධ පැළෑටි උද්‍යානයට අමතරව පිළිවෙළින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුල ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුලින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් ආරක්ෂා කර ඇත. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත ඖෂධ පැළෑටි උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස දායක වේ.

උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යාපනය කිරීමේ කාර්යයන් කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය මගින් මල්වගා පර්යේෂණ කටයුතු සහ විවිධ වැඩසටහන් තුලින් මල් වගා සංවර්ධන කටයුතු සිදුකරමින් ඒ හරහා රට තුල මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම කරනු ලබයි. කෙටිකාලීන පුහුණු පාඨමාලා, එක් අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩ සටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබාදීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය නැරඹීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ජනතාව සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුලින් සිදුවන මහඟු කාර්යයකි.

### 1.2. දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වා ගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

### 1.3 මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුළ ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය, අගය කිරීම තුලින් ශාක සම්පත ජනතාවට සමීප කරවීම.

## 1.4 ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමේලා විතැන් සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම.
2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව හා ශාක සම්පත් හා බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මල් වගා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත්හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
5. සුදුසු ස්ථාන වල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.
6. අලංකරණ උද්‍යාන විද්‍යාව (Amenity Horticulture) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
7. ශ්‍රී ලංකාවේ හඳුනා ගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබා දීම.
8. අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම

### 1.5 කාර්ය මණ්ඩල විස්තර

දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 749 ක් වන අතර, 2015.12.31 දින වන විට 648 දෙනෙකු සේවයේ යෙදී සිටී. ඒ පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

### 1.5.1 දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු - 2015.12.31 දිනට

| සේවක ගණය | වැටුප් ක්‍රමය | සේවය/ තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | SL – 3<br>SL - 1 | ශ්‍රී.ලං.වි.සේ<br>ශ්‍රී.ලං.පරි.සේ<br>ශ්‍රී.ලං.ගණ.සේ<br>ශ්‍රී.ලං.ඉං.සේ<br>ශ්‍රී.ලං.වා.වි.සේ | 33 | 15 |
| තෘතීය මට්ටම | MN – 7<br>MN – 6 | පරිපාලන නිලධාරි<br>ශ්‍රී.ලං.තා.සේ (විශේෂ ශ්‍රේණිය)<br>භාෂා පරිවර්තක | 09 | 05 |
| ද්විතීය මට්ටම | MN – 4<br>MN – 3<br>MN – 2<br>MN – 1<br>MT – 1 | වැඩසටහන් සහකාර<br>කෘෂි මෙහෙයුම් නිලධාරි<br>සංවර්ධන නිලධාරි<br>කෘෂි උපදේශක<br>උද්‍යාන සංවර්ධන සහකාර<br>පර්යේෂණ සහකාර<br>කාර්මික නිලධාරි<br>ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර<br>රාජ්‍ය කළමනාකරණ සේවය<br>ගාස්තු අයකිරීමේ සහකාර<br>තොරතුරු තාක්ෂණ සහකාර<br>උද්‍යාන වැඩමුලික | 186 | 113 |
| ප්‍රාථමික මට්ටම | PL – 3<br>PL – 2<br>PL – 1 | ශිල්පීය<br>අර්ධ ශිල්පීය<br>ශිල්පීය නොවන | 521 | 515 |
| **එකතුව** | | | **749** | **648** |

### 1.5.2. දෙපාර්තමේන්තු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | ආචාර්ය ඩී.එච්.පී. පෙරමුණුගම මයා |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | කේ.එන්. යාපා මයා |
| අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ ප්‍රචාරණ) | ආචාර්ය ෂෙලෝම් ඒ.ක්‍රිෂ්ණරාජා මෙනවිය |
| අධ්‍යක්ෂ (පාලන) | අයි.ඩබ්.එම්.සී.කේ. ඉලංගකෝන් මිය |
| ප්‍රධාන ගණකාධිකාරි | ඩබ්. ටී. යූ. ද මැල් මයා |
| සිවිල් ඉංජිනේරු | ඒ.එල්.එම්. මාහිර් මයා |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | එන්.ටී. ලියනගේ මිය |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | වයි. එම්. වයි. යාපා බණ්ඩාර මයා |
| පරිපාලන නිලධාරි | එන්.ඩබ්.යූ.ආර්. ජයලත් මයා |

### 1.5.3. දෙපාර්තමේන්තුවේ සෙසු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය | ආචාර්ය.ඒ.එම්.ඒ.එස්. අත්තනායක මිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මල්වගා පර්යේෂණ) | චන්ද්‍රිකා ජයවීර මිය |
| සහකාර අධ්‍යක්ෂ, ගම්පහ උද්භිද උද්‍යානය | එම්.එම්.ඩී.ජේ සේනාරත්න මයා |
| සහකාර අධ්‍යක්ෂ (නාරහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලය) | ආර්.එස්.ඩබ්. ගෝමස් මිය |
| පර්යේෂණ නිලධාරී /නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාතික ශාකාගාරය) | ආර්.ඒ.එස්.ඩබ්.රණසිංහ මිය |
| සහකාර අධ්‍යක්ෂ, සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය | පී. ඩී. එස්. විජේරත්න මයා |

## 1.6 සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ(පාලන)
ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ(තාක්ෂණ ප්‍රචාරණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (රා.උ.උ.) *
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගම්පහ උ.උ.)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාතික ශාකාගාරය)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මල්වගා හා තාක්ෂණ ප්‍රචාරණ)
අභ්‍යන්තර විගනක
සහකාර අධ්‍යක්ෂ (හක්ගල උ.උ.)
සහකාර අධ්‍යක්ෂ (තෙ.ක.උ.උ.) *
සහකාර අධ්‍යක්ෂ (වියලි ක.උ.උ.) *
සිවිල් ඉංජිනේරු
සහකාර අධ්‍යක්ෂ (පාලන)
පරිපාලන නිලධාරි
ආයතන අංශය
භාෂා පරිවර්තක
ගිණුම් අංශය
සහකාර අධ්‍යක්ෂ කොළඹ
සහ.අධ්‍යක්ෂ/ විදුහල්පති අධ්‍යාපන මධ්‍යස්ථානය
විගණන අංශය
හරිත පියස (මීගලෑව)
වන ඖෂධ උයන (ගනේවත්ත)
ජනපති මැදුර උද්‍යානය -මහනුවර
ජනපති මැදුර උද්‍යානය - අනුරාධපුර
ජනපති මැදුර උද්‍යානය - නුවරඑළිය
අගමැති මැදුර උද්‍යානය- නුවරඑළිය
ශාකාගාරය හක්ගල
ශාකාගාරය ගම්පහ
ශාකාගාරය අවිස්සාවේල්ල
ශාකාගාරය ගනේවත්ත
ශාකාගාරය පේරාදෙණිය
ජනපති මැදුර උද්‍යානය -කොළඹ
අරලියගහ මැදුර උද්‍යානය-කොළඹ
අගමැති කාර්යාලය (කොළඹ)
විසුම්පාය -කොළඹ
කාර්යභාර නිලධාරි යුධ සොහොන්
පොදු රාජ්‍ය මණ්ඩල යුධ සොහොන් ජාවත්ත බොරැල්ල ත්‍රි.මලය මහනුවර
*
රා.උ.උ. -රාජකීය උද්භිද උද්‍යානය
තෙ.ක.උ.උ. - තෙත් කලාපීය උද්භිද උද්‍යානය
වියලි ක.උ.උ. - වියලි කලාපීය උද්භිද උද්‍යානය

## 1.7 දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ආයතන සහ ඒකක

### පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වර්ෂ 1821 දි ස්ථාපිත කරන ලද අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනයට, ශාක පිළිබඳ අධ්‍යනයට හා පැළෑටි සංරක්ෂණයට දායකත්වයක් ලබා දෙයි.

අක්කර 150ක වපසරියකින් යුත් උද්‍යානය මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති අතර, අධ්‍යාපනය, උද්භිද විද්‍යාත්මක පර්යේෂණ, පරිසර විද්‍යාත්මක සහ උද්‍යාන බෝග වගාව සිදු කරන විනෝදාස්වාදය ලබා දෙන ස්ථානයක් ලෙස ප්‍රචලිත ය.

### ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය යනු ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක් රැස් කර ඇති ස්ථානයකි. බොහෝ විදේශික ශාක සහ වගා කරන ලද ශාක වල නිදර්ශක ද එහි දී දැකිය හැක. මෙහි 160,000 ආසන්න ශාකාගාර නිදර්ශක ප්‍රමාණයක් සංරක්ෂණය කර ඇත. ග්‍රන්ථ 3,500 පමණ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේ තැන්පත් කර ඇත.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක ශාක වර්ගීකරණ පර්යේෂණ, ජෛව විවිධත්ව පර්යේෂණ සඳහා සහ ශාක හඳුනා ගැනිමේ කාර්යයන්ට යොදා ගනී.

### හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දි ආරම්භ කළ අතර, ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම උද්භිද උද්‍යානයයි. උද්‍යානයට අයත් ශාක එකතුව උප නිවර්තන කලාපීය ශාක වේ.මෙම ශාක එකතුව ශ්‍රී ලංකාවට ආවේණික ශාක සහ වෙනත් රටවලින් හඳුන්වා දුන් කඳුකර ශාක වලින් සමන්විත වේ.

### හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරිම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, එහි වපසරිය අක්කර 43 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවලට අයත් ශාක විශේෂ 2000 ක පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

### මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය, මල්වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ මල් වගා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා කැපවී සිටී.

වගාකරුවන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර උපදේශන සේවාවන් සහ ආයෝජන අවස්ථා සපයමින් අවශ්‍ය උපකරණ සහ තත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීමට සහාය වෙමින් ක්ෂේත්‍රය වැඩිදියුණුවට දායක වේ.

### ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. උද්‍යානය අක්කර 52 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි, උද්‍යානයේ විශාල පරාසයක පැතිරී ඇත.

ගනේවත්ත වන ඖෂධ උද්‍යානය, දුර්ලභ ඖෂධ පැළෑටි සංරක්ෂණය කිරීම සහ ඖෂධ පැළෑටි ක්‍රමවත් වගා කිරීම හා දුර්ලභ ඖෂධීය ශාක වර්ග පිළිබඳව පර්යේෂණ කිරීමෙහි නිරත වෙයි.

### මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

අවුරුදු 130 කට පසු දේශීය විශේෂඥයින් විසින් සැලසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණ සහ ප්‍රාදේශීය ආර්ථිකය සංවර්ධනය මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

### ඉලුක්ඔිවිට තෙත් කලාපිය උද්භිද උද්‍යානය

අවිස්සාවේල්ල ප්‍රදේශය සමීපයෙහි මෙම උද්‍යානය පිහිටා ඇත. සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලද අතර 2015 මාර්තු මස විවෘත කරන ලදී. උද්භිද උද්‍යානය අක්කර 105 වපසරියකින් යුක්ත ය. පහතරට තෙත් කලාපීය ශාක විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත.

### සුවහස් මල් සෙවන, කොළඹ

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි “ සුවහස් මල්” මල් වගාකරුවන්ගේ සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය සඳහා සහාය වීම නාරාහේන්පිට පිහිටි “සුවහස් මල්”ඒකකයෙන් සිදු කරනු ලබයි.

### අතිගරු ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ නිළ නිවාස උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරය පිහිටි නිළ නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිළ නිවාස උද්‍යාන නඩත්තු කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

### පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධයේදී මියගිය පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශයේ පවත්වා ගෙන යයි. යුධ සොහොන් ඒකකවල උද්‍යාන වල නඩත්තු හා කළමනාකරණ කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි.

### මීගලෑව හරිත පියස

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හැතැප්ම 60 දුරකින් මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය අක්කර 6 කි. එය සංවර්ධනය වෙමින් පවති. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට සහ ප්‍රදේශයේ ජනතාවට ශාක ප්‍රචාරණය පිළිබඳ පුහුණු පාඨමාලා පවත්වාගෙන යන මධ්‍යස්ථානයක් ලෙස ඉදිරියේදී කටයුතු කරනු ඇති අතර ශාක ප්‍රචාරණ කටයුතු සිදුකිරීම ද කරනු ලබයි.

## 2. 2015 වසරේ ලැබූ ප්‍රගතිය

### 2.1 නරඹන්නන්ගේ පැමිණීම

2015 වසරේදී ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඒකක ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී.

මෙම වසර තුළ දී උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුලු සංචාරකයින් සංඛ්‍යාව 2,623,255 ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 2,215,702 ක් දේශීය සංචාරකයින් වන අතර 407,553 ක් විදේශීය සංචාරකයන් වේ.

2015 වසර තුළ උද්භිද උද්‍යාන කරා දේශීය සංචාරකයින් ගේ පැමිණීම පසුගිය අවුරුද්දට (2014) සාපේක්ෂව 18% කි න්ද විදේශීය සංචාරකයින් පැමිණීම 17% කි න්ද ඉහළ ගොස් ඇත.

### 2.2. 2015 වසර තුල උද්භිද උද්‍යාන කරා පැමිණි මුළු නරඹන්නන් සංඛ්‍යාව




### 2.2. 2011 වර්ෂයේ සිට 2015 තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| දේශීය නරඹන්නන් සංඛ්‍යාව | 1,862,222 | 1,931,914 | 1,783,069 | 1,893,522 | 2,215,702 |
| විදේශීය නරඹන්නන් සංඛ්‍යාව | 236,763 | 259,545 | 293,454 | 345,468 | 407,553 |
| එකතුව | **2,098,985** | **2,191,459** | **2,076,523** | **2,238,990** | **2,623,255** |

## 2.3. 2015 වසරේ උද්භිද උද්‍යාන කරා පැමිණි දේශීය හා විදේශීය නරඹන්නන් සංඛ්‍යාව




## 2.4. 2015 උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

| නරඹන්නන්ගේ සංඛ්‍යාව | පේරාදෙණිය | හක්ගල | ගම්පහ | මිරිජ්ජවිල | සීතාවක | එකතුව |
|---|---|---|---|---|---|---|
| දේශීය වැඩිහිටි | 859,664 | 537,803 | 183,520 | 25,459 | 51,331 | **1,657,777** |
| දේශීය ළමුන් | 299,705 | 196,624 | 17,149 | 13,727 | 8,024 | **535,229** |
| ජ්‍යෙෂ්ඨ පුරවැසි | 9,559 | 7,706 | 1,077 | 1,865 | 2,489 | **22,696** |
| දේශීය නරඹන්නන්ගේ එකතුව | 1,168,928 | 742,133 | 201,746 | 41,051 | 61,844 | 2,215,702 |
| විදේශීය වැඩිහිටි | 358,071 | 21,825 | 314 | 42 | 33 | **380,285** |
| විදේශීය ළමුන් | 18,544 | 2,015 | 12 | 1 | 3 | **20,575** |
| විදේශීය සිසුන් | 6,316 | 348 | 18 | 4 | 7 | **6,693** |
| විදේශීය නරඹන්නන්ගේ එකතුව | 382,931 | 24,188 | 344 | 47 | 43 | 407,553 |
| නරඹන්නන්ගේ මුළු එකතුව | 1,551,859 | 766,321 | 202,090 | 41,098 | 61,887 | 2,623,255 |

## 3. ආදායම

2015 වර්ෂයේ උද්‍යාන ඇතුල්වීමේ ගාස්තු, පැළ අලෙවිය යනාදියෙන් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලබාගත් සම්පුර්ණ ආදායම රුපියල් මිලියන 568.4 කි (නරඹන්නන් ගෙන් රුපියල් මිලියන 523.6 ක් ද පැළ අලෙවියෙන් හා අනෙකුත් ආදායම් හරහා 44.8 ක් ද වශයෙනි). එය පසුගිය අවුරුද්දේ ඉහත කාල පරිච්ඡේදයට සාපේක්ෂව 18 % ක වැඩිවීමකි.

### 3.1. 2011 වර්ෂයේ සිට 2015 දක්වා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට නරඹන්නන්ගේ පැමිණීමෙන් පමණක් ලැබුණු මුලු ආදායම

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 75.1 | 77.6 | 73 | 75.9 | 88.5 |
| විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 253.9 | 279 | 314.9 | 369.8 | 435.1 |
| **එකතුව (රු.මි)** | **329.0** | **356.6** | **387.9** | **445.7** | **523.6** |

### 3.2. 2015 වර්ෂයේ උද්භිද උද්‍යානයන්/ඒකකයන් හි මුලු ආදායම (%)



### 3.3. දෙපාර්තමේන්තුවේ මුලු ආදායම (ඒකක වශයෙන්)

| ඒකක | මුළු ආදායම (රු) |
|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය | 479,036,738.72 |
| හක්ගල උද්භිද උද්‍යානය | 59,194,023.30 |
| ගම්පහ උද්භිද උද්‍යානය | 19,174,752.50 |
| ගනේවත්ත ඖෂධ උද්‍යානය | 1,530,132.50 |
| වියළි කලාපීය උද්‍යානය , හම්බන්තොට | 3,261,651.06 |
| තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 5,966,821.00 |
| "සුවහස් මල් සෙවණ" පැළ තවාන, බත්තරමුල්ල | 241,345.00 |
| **එකතුව** | **568,405,464.08** |

## 4. මූල්‍ය ප්‍රගතිය

ප්‍රධාන උද්‍යානයන් හි සහ ඒකකවල සංවර්ධන කටයුතු සැලසුම් කළ පරිදි සිදුකල අතර 2015 වන විට මූල්‍යමය ප්‍රගතිය 97 % ක් වේ.

### 4.1 2015 වර්ෂයේ වැය විස්තරය

| විස්තරය | මුළු ප්‍රතිපාදන (රු.මි) | මුළු වැය (රු.) | % |
|---|---|---|---|
| **ප්‍රාග්ධන වැය** | 369.3 | 349.2 | 95% |
| **පුනරාවර්තන වැය** | 337.211 | 334.8 | 99% |

### 4.2. පුනරාවර්තන වැය

| වැය ශීර්ෂ කේතය | විෂය මූලික විස්තර | ප්‍රතිපාදන 2015 (රු. 000') | මුළු වියදම 2015 (රු. 000') | ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) | ඉතිරි ප්‍රතිපාදන (රු. 000') | මුලු වියදම ශුද්ධ ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | **පුද්ගල වේතන** | **280,301,000.00** | **277,185,027.16** | **276,810.084** | **3,490.916** | **99%** |
| 1001 | වැටුප් සහ වේතන | 115,337,000.00 | 114,537,071.73 | 114,214.054 | 1,122.946 | 99% |
| 1002 | අතිකාල සහ නිවාඩු සඳහා ගෙවීම් | 5,000,000.00 | 4,150,794.66 | 4,150.251 | 849.749 | 83% |
| 1003 | අනෙකුත් දීමනා | 159,964,000.00 | 158,497,160.77 | 158,445.779 | 1,518.221 | 99% |
| | **ප්‍රවාහන වියදම්** | **1,850,000.00** | **1,768,474.44** | **1,767.090** | **82.910** | **95%** |
| 1101 | දේශීය | 1,500,000.00 | 1,419,494.19 | 1,418.110 | 81.890 | 94% |
| 1102 | විදේශීය | 350,000.00 | 348,980.25 | 348.980 | 1.020 | 100% |

| විෂය ශීර්ෂය | විෂය මූලික විස්තර | ප්‍රතිපාදන 2015 (රු. 000') | මුළු වියදම 2015 (රු. 000') | ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) | ඉතිරි ප්‍රතිපාදන (රු. 000') | මුලු වියදම ශුද්ධ ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | **සැපයුම්** | **7,860,000.00** | **7,893,835.69** | **7,841.186** | **18.814** | **100%** |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 700,000.00 | 699,385.06 | 699.385 | 0.615 | 100% |
| 1202 | ඉන්ධන | 3,210,000.00 | 3,245,955.70 | 3,193.306 | 16.694 | 100% |
| 1203 | ආහාර සහ නිල ඇඳුම් | 250,000.00 | 249,146.20 | 249.146 | 0.854 | 100% |
| 1205 | අනෙකුත් දෑ | 3,700,000.00 | 3,699,348.73 | 3,699.349 | 0.651 | 100% |
| | **නඩත්තු වැය** | **3,250,000.00** | **3,064,578.26** | **3,045.616** | **204.384** | **94%** |
| 1301 | වාහන | 2,000,000.00 | 1,845,074.24 | 1,826.112 | 173.888 | 91% |
| 1302 | පැළෑටි , යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 600,000.00 | 570,996.48 | 570.996 | 29.003 | 95% |
| 1303 | ගොඩනැගිලි සහ නිර්මාණ | 650,000.00 | 648,507.54 | 648.507 | 1.492 | 100% |
| | **සේවාවන්** | **42,550,000.00** | **43,449,784.84** | **41,925.191** | **624.809** | **99%** |
| 1401 | ප්‍රවාහන | 900,000.00 | 694,087.00 | 694.087 | 205.913 | 77% |
| 1402 | තැපැල් සහ විදුලි සංදේශ | 1,600,000.00 | 1,581,358.39 | 1,564.037 | 35.963 | 98% |
| 1403 | විදුලිය සහ ජලය | 5,400,000.00 | 6,536,351.52 | 5,029.479 | 370.521 | 93% |
| 1404 | කුළී සහ දේශීය බදු | 700,000.00 | 699,949.05 | 699.949 | 0.051 | 100% |
| 1405 | අනෙකුත් සේවාවන් | 33,950,000.00 | 33,938,038.88 | 33,937.639 | 12,361.12 | 100% |
| | **සංක්‍රාම** | **1,400,000.00** | **1,400,000.00** | 1,400.000 | **0.00** | **100%** |
| 1506 | දේපල ණය පොලිය | 1,400,000.00 | 1,400,000.00 | 1,400.000 | 0.00 | 100% |
| **එකතුව** | | **337,211,000.00** | **334,761,700.39** | **334,761,700.39** | **4,421,833.06** | **99%** |

## 4.3. ප්‍රාග්ධන වැය

| උප ව්‍යාපෘති | විෂය මූලික කේතය | විෂය මූලික විස්තර | ප්‍රතිපාදන 2015 (රු. 000') | මුළු වියදම 2015 (රු. 000') | ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) | ඉතිරි ප්‍රතිපාදන (රු. 000') | මූල වියදම ශුද්ධ ප්‍රතිපාද නවල % ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | | **ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම** | **4,350,000.00** | **4,091,327.19** | **4,091,327.19** | **258,672.81** | **94.1%** |
| 0 | 2001 | ගොඩනැගිලි සහ නිර්මාණ | 3,000,000.00 | 2,895,710.53 | 2,895,710.53 | 104,289.47 | 96.5% |
| 0 | 2002 | පැළැටි යන්ත්‍ර සූත්‍ර සහ | 550,000.00 | 493,635.66 | 493,635.66 | 56,364.34 | 89.8% |
| 0 | 2003 | වාහන | 800,000.00 | 701,981.00 | 701,981.00 | 98,019.00 | 87.7% |
| | | **ප්‍රාග්ධන වත්කම් අත්කර** | **8,650,000.00** | **7,753,138.25** | **7,753,138.25** | **896,861.75** | **89.6%** |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 600,000.00 | 580,409.75 | 580,409.75 | 19,590.25 | 96.7% |
| 0 | 2103 | පැළැටි යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 550,000.00 | 541,582.75 | 541,582.75 | 8,417.25 | 98.5% |
| 0 | 2104 | ගොඩනැගිලි සහ නිර්මාණ | 5,000,000.00 | 4,145,539.24 | 4,145,539.24 | 854,460.76 | 82.9% |
| 0 | 2105 | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | 2,500,000.00 | 2,485,606.51 | 2,485,606.51 | 14,393.49 | 99.4% |
| | | **ප්‍රාග්ධන පැවරීම්** | | | | | |
| 0 | 2201 | **උද්භිද උද්‍යාන භාර අරමුදල** | 100,000,000.00 | 100,000,000.00 | 100,000,000.00 | 0.00 | 100.0 % |
| 0 | 2401 | පුහුණුව සහ ගොඩනැගීමේ ධාරිතාවය | 300,000.00 | 237,260.00 | 237,260.00 | 62,740.00 | 79.1% |
| | | **විශේෂ ව්‍යාපෘති** | | | | | |
| 1 | 2105 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සහ ගම්පහ උද්‍යානය | 35,000,000.00 | 34,907,638.53 | 34,907,638.53 | 92,361.47 | 99.7% |
| 2 | 2105 | මල්වගා සංවර්ධන වැඩසටහන | 30,000,000.00 | 33,183,755.55 | 29,954,076.29 | 45,923.71 | 99.8% |

| උප ව්‍යාපෘති | විෂය මූලික ක්ෂේත්‍රය | විෂය මූලික විස්තර | ප්‍රතිපාදන 2015 (රු. 000') | මුළු වියදම 2015 (රු. 000') | ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) | ඉතිරි ප්‍රතිපාදන (රු. 000') | මුළු වියදම ශුද්ධ ප්‍රතිපාද නවල % ලෙස |
|---|---|---|---|---|---|---|---|
| 3 | 2105 | වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 130,000,000.00 | 117,750,585.29 | 117,750,585.29 | 12,249,414.71 | 90.6% |
| 4 | 2105 | තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 40,000,000.00 | 36,716,776.88 | 36,670,172.63 | 3,329,827.37 | 91.7% |
| 6 | 2105 | මල්වගා ප්‍රවර්ධන වැඩසටහන් | 5,000,000.00 | 5,015,170.70 | 4,898,575.70 | 101,424.30 | 98.0% |
| 7 | 2105 | මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය | 7,000,000.00 | 6,999,425.17 | 6,984,910.39 | 15,089.61 | 99.8% |
| 8 | 2105 | උද්භිද විද්‍යාත්මක සංගණනය | 1,000,000.00 | 1,005,811.79 | 997,311.79 | 2,688.21 | 99.7% |
| 9 | 2105 | උතුරේ නව උද්භිද උද්‍යානයක් ඇති කිරීම | 3,000,000.00 | 0.00 | 0.00 | 3,000,000.00 | 0.0% |
| 10 | 2105 | මල්වගා සහ දැයට කිරුළ ප්‍රදර්ශන ක්‍රියාකාරකම් | 5,000,000.00 | 5,003,316.33 | 4,977,431.96 | 22,568.04 | 99.5% |
| **එකතුව** | | | **369,300,000.00** | **352,664,205.68** | **349,222,428.02** | **20,077,571.98** | **94.6%** |

### 4.4. දෙපාර්තමේන්තුවට 2015 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන හා වියදම

| වැඩසටහන | 2015 දී වෙන් වූ රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන (රු.මි.) | 2015 දිනට රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන වියදම (රු.මි.) | 2015 දී උද්භිද උද්‍යාන භාර අරමුදලින් වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.) | 2015 උද්‍යාන භාර අරමුදලින් වූ වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 7.5 | 7.04 | 32.25 | 26.15 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 23.415 | 22.94 | 5.5 | 5.11 |
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 2.85 | 2.95 | 8.83 | 6.76 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 12.5 | 12.34 | 0.00 | 0.00 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 7 | 6.99 | 0.00 | 0.00 |
| අධ්‍යාපනය සහ පුහුණු | 0.3 | 0.24 | 1.1 | 1.04 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ | 1.03 | 1 | 0.35 | 0.33 |
| ජාතික මල්වගා සංවර්ධන, ප්‍රවර්ධන සහ ප්‍රදර්ශනවැඩසටහන | 40 | 39.83 | 0.00 | 0.00 |
| සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 40 | 36.67 | 16 | 15.66 |
| මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 130 | 117.75 | 0.00 | 0.00 |
| උතුරු පළාතේ නව උද්භිද උද්‍යානයක් ස්ථාපිත කිරීම | 3 | 0.00 | 0.00 | 0.00 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු | 1.705 | 1.5 | 35.97 | 33.59 |
| **එකතුව** | **269.3** | **249.2** | **100** | **88.64** |

# 5. 2015 දී උද්භිද උද්‍යානයන් හි සිදුකල සංවර්ධන වැඩසටහන් හි භෞතික ප්‍රගතිය

## 5.1 මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට

අනුමත ප්‍රතිපාදන: රු.මි. 130

වැය: රු.මි. 117.7



උද්‍යානයේ ආකර්ෂණීය දසුනක්

උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් නව වැසිකිළි සංකීර්ණ 02ක ඉදි කිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර ඉදිකිරීම් කටයුතු වලින් 90 % ක් අවසන් කරන ලදී. උද්‍යානයේ ඇතැම් කොටස් වල බාහිර පෙනුම සහ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉන්ටර්ලොක් ගල් ඇතිරීමෙන් උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු වෙමින් පවතින අතර මෙම වසරේ සැලසුම් කරන ලද වැඩිදියුණු කිරීම් කටයුතු වලින් 60% ක වැඩ අවසන් ව ඇත. මීට අමතරව නරඹන්නන් සඳහා ස්ථාපිත පානීය ජල පහසුකම් ඉහළ නැංවීමේ අරමුණින් පානීය ජල කරාම 05 ක ඉදි කිරීම් කටයුතු ද ආරම්භ කර ඇත.

මහජනතාව තුල විශේෂයෙන් වියළි කලාපීය ශාක පිළිබඳ දැනුම වර්ධනය, එම ශාක ජනතාවට සමීප කිරීම සහ සංරක්ෂණය අරමුණු කරගනිමින් සෙවන ලැදි ශාක සහ දුර්ලභ ශාක මහජනතාවට ප්‍රදර්ශණය සඳහා පැළ ගෘහයක් ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කර සිදුවෙමින් පවතින අතර එලිමහන් පතොක් ශාක සංරක්ෂණාගාරයක ඉදි කිරීම් කටයුතු සිදුවෙමින් පවතී. මෙම ඉදි කිරීම් කටයුතු වලින් 60 % ක් වැඩ දැනට අවසන් වී ඇත.



උද්‍යානයේ ඉදිරි පස ඇතුල්වීමේ කොටස නව ප්‍රවේශ පත්‍ර කවුළුවක් සමග වැටක් ඉදිකර නවීකරණය වෙමින් පවතින අයුරු

ප්‍රවේශ පත්‍ර මිළදී ගෙන පැමිණෙන නරඹන්නන් ගේ පහසුව සහ අනවසරයෙන් උද්‍යාන භූමිය භාවිතා කරන පිරිස් පාලනය සඳහා උද්‍යානයේ ඉදිරි පස ඇතුල්වීමේ කොටස නව ප්‍රවේශ පත්‍ර කවුළුවක් සමග වැටක් ඉදිකර නවීකරණය කරන ලදී.

උද්‍යානයට ආරක්ෂාව සපයන ආරක්ෂක

නිලධාරීන්ගේ සේවා පහසුකම් සැපයීමේ අරමුණින් ආරක්ෂක කාර්යාලක ඉදිකිරීම් කටයුතු නිම කර ඇති අතර උද්‍යානයේ කාර්ය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි ආරක්ෂක කුටි 04 ක් ඉදි කරන ලදී.

කම්කරුවන් සහ තාක්ෂණ නිලධාරීන් සියළුදෙනාගේ වැඩබිම් ඒකරාශී කර ඒ සඳහා කාර්ය මණ්ඩල උපයෝගිතා ගොඩනැගිල්ලක් ද සියළුම පහසුකම් සහිතව ඉදි කරමින් පවතී. එහි ඉදි කිරීම් කටයුතු වලින් 50 % ක වැඩ දැනට අවසන් වී ඇත.


එළිමහන් පතොක් ශාක සංරක්ෂණාගාරයේ ඉදි කිරීම් කටයුතු සිදුවෙමින් පවතින අයුරු

දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස 02 ට අමතරව අළුතින් නිල නිවාස 02 ක ඉදිකිරීම් සහ උද්‍යානයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා පරීක්ෂණාගාරයක් ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. මෙම ඉදි කිරීමේ කටයුතු වලින් 30 % ක් වැඩ දැනට අවසන් වී ඇත.

මීට අමතරව පසුගිය අවුරුද්දේ (2014) ආරම්භ කළ උද්‍යානය වටා විදුලි වැට ස්ථාපනය කිරීමේ කටයුතු මෙම වසරේ නිම කරන ලදී.

උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ පඳුරු උද්‍යාන වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.


කාර්ය මණ්ඩල උපයෝගිතා ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සිදුවෙමින් පවතින අයුරු

ප්‍රධාන උද්‍යානයේ උද්‍යාන භූමි අලංකරණය, නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, පඳුරු උද්‍යාන කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

ප්‍රදේශයේ මල් වගාකරුවන් හට පහසුකම් සැපයීම සඳහා උද්‍යානයේ මල් වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කර ඇත. උද්‍යානයේ සජීවී ශාක එකතුව වැඩිදියුණු කර ඇති අතර මල් වගා ව්‍යාප්ති කාර්යාලයේ පහසුකම් ද වැඩිදියුණු කර ඇත.

ප්‍රදේශයේ මල් වගාකරුවන් දිරිගැන්වීම සඳහා සෙවන දැල් ඇතුළු රෝපණ ද්‍රව්‍ය ඔවුන් අතර බෙදා දෙන ලද අතර ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම විවිධ වැඩමුළු හා පුහුණු සැසි හරහා ලබාදෙන ලදී.

## 5.2 . සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

අනුමත ප්‍රතිපාදන : ප්‍රග්ධන දීමනා වලින් රු. මි. 40 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි.16

වැය : රු.මි. 52.3



උද්‍යානයේ ආකර්ෂණීය දසුනක්

අවිස්සාවේල්ල හි පිහිටි සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය 2015 මාර්තු මස 25 වන දින ගරු ක්‍රීඩා සහ සංචාරක අමාත්‍ය නවින් දිසානායක මැතිතුමා අතින් විවෘත කර ජනතා අයිතියට පවරන ලදී.

උද්‍යානය ජනතාවට විවෘත වීමත් සමග උද්‍යානයේ නරඹන්නන් සඳහා වන පහසුකම් පවත්වා ගැනීම, නඩත්තු කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සහ නව පහසුකම් ඇති කිරීමේ කටයුතු සිදු කරන ලදී.



උද්‍යානය විවෘත කල අවස්ථාව

ඒ අනුව, වනෝද්‍යානයේ සුන්දර වටපිටාව මැදින් උද්‍යානයේ ඉහළ ප්‍රදේශය නැරඹීමට යන අතර මග නැරඹුම් ස්ථානයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ඉදිකිරීම් කටයුතු වලින් 80% ක් පමණ මේ වන විට අවසන්ව ඇත. මෙම නැරඹුම් ස්ථානයේ සිට උද්‍යානයේ පහළ බලන විට මුළු උද්‍යනයේ ම දර්ශනීය දසුනක් නරඹන්නන්ට දැකගැනීමට හැකි වේ.

නරඹන්නන් සඳහා පහසුකම් ඇතිකිරීමේ අරමුණින් නව වැසිකිළි පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු අවසාන කරන ලදී. උද්‍යානයට පැමිණෙන නරඹන්නන්ගේ විනෝදාස්වාදය සඳහා උද්‍යානය මධ්‍යයේ පිහිටි වැවට පැදිය හැකි බෝට්ටු හඳුන්වාදෙන ලදී. උද්‍යානයේ සියළුම ගොඩනැගිලි තීන්ත ආලේප කර පිළිසකර කරන ලදී. ක්ෂේත්‍ර කාර්යාලයක හා ස්ටෝරුවක අවශ්‍යතාවය නවීකරණය කළ කන්ටේනර 03ක් උද්‍යානය තුල ස්ථාපිත කිරීම මගින් සපුරා ගන්නා ලදී.

උද්‍යානයේ ඉහළ ප්‍රදේශයේ ස්ථාපිත රෝස උද්‍යානය සඳහා ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු අවසන් කරන ලද අතර ආරක්ෂාව සඳහා වැටක් ද ස්ථාපනය කරන ලදී.



**නරඹන්නන්, උද්‍යානය මධ්‍යයේ පිහිටි වැවෙ හි බෝට්ටු පදිමින් විනෝද වන අයුරු**

උද්‍යානයට අලුතින් අත්පත් කරගත් ප්‍රදේශයෙ හි ස්ථාපිත පැරණි ගොඩනැගිලි 02ක් නිල නිවාස ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පිරිනමා ඇති අතර ඉදිකිරීම් කටයුතු ආරම්භකර ඇත. එම ප්‍රදේශයේ මාර්ග වල තත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉන්ටර්ලොක් ඇතිරීමේ කටයුතු ද සැලසුම් කර ඇත.

උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා ජපන් උයනක් ස්ථාපනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර ගිම්හාන කුටි 02 ක් ඉදි කිරීම් කටයුතු ද සැලසුම් කර ඇත. උද්‍යානය වටා මාර්ග පුවරු ස්ථාපිත කිරීම ද සිදු විය.

ප්‍රධාන උද්‍යානයේ උද්‍යාන භූමි අලංකරණය, නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තුව සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

තණබිම් ප්‍රදේශය සහ ශාක එකතුව මනා ලෙස පවත්වා ගනිමින් රුක් උයනේ අක්කර පහක භූමි ප්‍රදේශය උසස් තත්වයකින් පවත්වාගෙන යන ලදී.

## 5.3 ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 1.03ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 0.35

වැය : රු.මි. 1.3



**ලයිකන පිළිබඳ තෙදින වැඩමුළුවේ අවස්ථාවක්**

ශාක වර්ගීකරණ පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවේ ලයිකන

පිළිබඳ තෙදින වැඩමුළුවක් 2015 වර්ෂයේ මාර්තු 05 සිට 07 දක්වා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලදී. ඩිල්මා සංරක්ෂණ වැඩසටහනේ සහයෝගීත්වයෙන් ජාතික ශාකාගාරය මගින් සංවිධානය කරන ලද වැඩමුළුව මෙහෙය වන ලද්දේ ලන්ඩනයේ ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ ආචාර්ය පැට් වොල්සෙලේ (Dr. Pat Wolseley), නෙදර්ලන්තයේ ශාකාගාරයේ ආචාර්ය ඒ. ඇප්ට්රූට් (Dr. A. Aptroot), චිකාගෝ හි ක්ෂේත්‍ර කෞතුකාගාරයේ මහාචාර්ය මාර්සෙලා කැසෙරස් (Prof. Marcela Caceres) සහ පේරාදෙණිය සහ සබරගමුව විශ්ව විද්‍යාලයේ ආචාර්ය ගෝතමී වීරකෝන් මහත්මිය හා ආචාර්ය ආනන්ද ජයලාල් මහතා විසිනි.

ජෛව විවිධත්ව සංරක්ෂණය සහ ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ වැඩමුළු ප්‍රදේශයේ පාසල් සිසුන් 100 ක ගේ සහභාගීත්වයෙන් මිරිජ්ජවිල වියළි කලාපීය උද්‍යානයේ දී ද මහනුවර ප්‍රදේශයේ පාසල් සිසුන් 100 ක් සහ ගුරුභවතුන් 20 ක ගේ ද, කුරුණෑගල ප්‍රදේශයේ පාසල් සිසුන් 100 ක් සහ ගුරුභවතුන් 16කගේ ද, මාතලේ ප්‍රදේශයේ පාසල් සිසුන් 115 ක් සහ ගුරුභවතුන් 20ක ගේද, සහභාගීත්වයෙන් රාජකීය උද්භිද උද්‍යානයේ අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානයේ දී ද පවත්වන ලදී. මෙහිදී ජෛව විවිධත්වය යනු කුමක්ද යන්න සහ ජෛව විවිධත්ව සංරක්ෂණයෙහි වැදගත්කම සහ ශාකාගාරයෙහි දායකත්වය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කෙරිණි.



ජෛව විවිධත්වය සහ ශාක ආශ්‍රිතව දේශණ සහ පුහුණු වැඩසටහන් පාසැල් ළමුන්හට පවත්වමින්

ඉහත වැඩමුළු වලට අමතරව ශාකාගාර ක්‍රමවේද සහ කළමනාකරණය, ජෛව විවිධත්වය සහ ශාක ආශ්‍රිතව සෙසු දේශන සහ පුහුණු වැඩසටහන් පාසැල් ළමුන් ඇතුළුව රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් 611ක් සඳහා පවත්වන ලදි.

උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් වියළි සහ තෙත් කලාපීය තර්ජනයට ලක්වූ ශාක ඉලක්ක කරගනිමින් ශාක ගවේෂණ කටයුතු මෙම වසරේ දී ද සිදු කරන ලදී. මීට අමතරව ඉහළ කඳුකර ප්‍රදේශයේ ශාක ගවේෂණ කටයුතු නමුණුකුල, පිදුරුතලාගල සහ තොටුපල කන්ද ආශ්‍රිතව ද සිදු කරන ලදී.

උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ 23 ක් සිදු කරන ලද අතර සජීවී සපුෂ්ප ශාක නිදර්ශක 954ක්, මීවන ශාක නිදර්ශක 36ක් සහ පාසි ශාක නිදර්ශක 73 ක් එකතු කෙරිණි. මෙම ශාක නිදර්ශක අතුරින් තර්ජනයට ලක් වූ ශාක හඳුනා ගැනීම සිදුකළ අතර අවදානමට ලක්වූ ශාක 34ක් ද, අනාගතයේ දී අවදානමට ලක්විය හැකි ශාක 49 ක්ද, තර්ජනයට ලක්වීමට ආසන්න ශාක 41 ක්ද

හඳුනා ගන්නා ලදී. ශාක විතැන් සංරක්ෂණ ක්‍රමවේද යොදාගනිමින් අවශ්‍ය අවස්ථා වලදී ශාක සංරක්ෂණ කටයුතු ද සිදු කරන ලද අතර රැස් කර ගන්නා ලද නිදර්ශක ජාතික ශාකාගාරයේ ඉදිරි විමර්ශණ කටයුතු සඳහා ද තබා ගන්නා ලදි.

"Moss Flora in Central Highlands of Sri Lanka" මෙම අවුරුද්දේ ප්‍රකාශයට පත් කරන ලද අතර "Wild Flowers of Sri Lanka" යන ග්‍රන්ථ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරිම සඳහා මුද්‍රණය වෙමින් පවතී. "Wild Flowers of Sri Lanka" ග්‍රන්ථයෙහි ඡායරූප සහිත නිදර්ශක 250ක විද්‍යාත්මක තොරතුරු, පොදු නාම, සංරක්ෂණ තත්ත්වයන්, වාසස්ථාන අඩංගුය. "Moss Flora in Central Highlands of Sri Lanka" ග්‍රන්ථයෙහි ශ්‍රී ලංකාවේ මධ්‍යම උස්බිම් වල පාසි ශාක පිළිබඳ විස්තර අන්තර්ගත වේ. Common Wayside Trees of Sri Lanka" යන ග්‍රන්ථ සංග්‍රහයෙ හි සංස්කරණ කටයුතු මෙම වසර තුලදී සිදු කරන ලදී. එහි ඡායාරූප සහිත නිදර්ශක 200 කද විද්‍යාත්මක තොරතුරු පොදු නාම, සංරක්ෂණ තත්ත්වයන්, වාසස්ථාන අඩංගුය. ග්‍රන්ථ දෙකෙහිම තොරතුරු සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් යුක්ත වේ. ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්වූ ශාක,පාසි, ඇල්ගී, පර්ණාංග, විවෘත බීජක යන පහත් ශාක (lower plants) පිළිබඳ හා ආක්‍රමණික ශාක පිළිබඳ අත් පත්‍රිකා 12ක් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී.




**"Moss Flora in Central Highlands of Sri Lanka" ග්‍රන්ථය**

ජාතික ශාකාගාරයේ තැන්පත් රූප සටහන් සහ නිදර්ශක සංඛ්‍යාව නිර්ණයට සහ අධ්‍යනය පහසු කිරීමේ අරමුණින් එම නිදර්ශක වලට ප්‍රවේශ අංකයන් (Accession number) ලබා දී ඒවා දත්ත පද්ධතියකට ඇතුලත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

ශාකාගාරයේ ශාක විශේෂ නිදර්ශක, පුස්තකාල එකතුව සහ සෙසු අනුයාත එකතුන් රැක බලා ගැනීමේ සහ නඩත්තු කටයුතු නොකඩවා හොඳින් පවත්වා ගෙන යන ලදී.

## 5.4 ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන



මල් ප්‍රදර්ශනයක් පවත්මින්

අනුමත ප්‍රතිපාදන: රුපියල් මිලියන 40
වැය : රු.මි. 39.8

පහළ සහ මධ්‍ය ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්වය නගා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.

දිවයින පුරා මල්වගා ව්‍යාප්තිය සඳහා මල්වගා ගොවි සංගම් ප්‍රමාණය 155 දක්වා ඉහළ නංවමින් මෙම වර්ෂය තුලදී නව ගොවි සංගම් 19 ක් පිහිටුවන ලදී. ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා, කැපු පත්‍ර සහ පටක රෝපණය පිළිබඳ පුද්ගලයින් 11,901 ක් පුහුණු කර ඇත.

මල්වගා කරුවන්ගේ කාර්මික සහ සෙසු නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 08 ක් පවත්වන ලද අතර වගා කරුවන් 452 ක් පුහුණු කරන ලදී.



වගා කරුවන් සඳහා ක්ෂේත්‍ර උපදෙස් ලබා දෙමින්

මල්වගාකරුවන්ගේ මල්වගාවන් අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ ප්‍රදර්ශන 154 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ විශාල ප්‍රදර්ශන 15 ක් පවත්වන ලදී. මල් වගා කරුවන්ගේ පැළ තවාන් 1,345 කට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබාදෙන ලදී.

"Catalogue on Anthurium Hybrids" යන නමින් ඇන්තූරියම් වගාවේ නව දෙමුහුන් නාමාවලියක් ප්‍රකාශයට පත්වුනු අතර ඇන්තූරියම් වගාව සහ ඕකිඩ් වගාව සම්බන්ධ පොත් පිංචවල තොරතුරු නැවත සංස්කරණය කර මුද්‍රණය කරන ලදී.

ආනයනය කරන ලද උසස් තත්වයේ ඕකිඩ් සහ ජර්බෙරා මව් ශාක සහනදායි මිලට සපයා දෙමින් නව ශාක ප්‍රභේද වගා කරුවන් හට හඳුන්වා දෙන ලදී.



වගා කරුවන් සඳහා වැඩමුළු සංවිධානය කරමින්

වගා කරුවන් අතර බෙදා හැරීම සඳහා පාරජම්බුල කිරණ ප්‍රතිකාර පොලිතීන් සහ සෙවන දැල් මිලදී ගැනීම් සිදු කල අතර බෙදාදීම් කටයුතු සැලසුම් කරමින් පවතී.

රටෙහි මල් වගා කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදු කරන ලද අතර වර්තමානයේ වගා කරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ කිහිපයක්ද ක්‍රියාත්මක කරන ලදී.

ක්ෂේත්‍රයේ දී සහ රසායනාගාර පහසුකම් යටතේ ඕකිඩ් දෙමුහුන් වර්ග සහ ඇන්තූරියම් වර්ග කීපයක් සකසනු ලැබිණි.

සියළුම උද්‍යානයන් හි මල්වගා අංශ වල පැළ තවාන් උසස් මට්ටමකින් නඩත්තු කල අතර වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු කරන ලදී. හක්ගල සහ ගම්පහ උද්‍යානයන් හි පැළ ගෘහය සහ, වීදුරු ගෘහයන් වල තත්වය ඉහළ නැංවීමේ අරමුණින් අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. මීට අමතරව පේරාදෙණිය උද්‍යානයෙහි ඕකිඩ් ප්‍රදර්ශන ගෘහයෙහි වහල හා ඕකිඩ් පැළ තවාන් ගෘහය අළුත්වැඩියා කෙරිණි.

## 5.5 අධ්‍යාපනය සහ පුහුණුව



ත්‍රෛමාසික සහතිකපත්‍ර පාඨමාලාවේ සිසුන් භූ අලංකරණ පුහුණුවීම් වල නියැලෙමින්

| |
|---|
| අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 0.3ක් සහ<br>උද්භිද උද්‍යාන භාර අරමුදලෙන් රු.මි. 1 .1 |

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කරන ලදී. තරුණයින් 55 කු නවීන මල් වගා ක්‍රමවේද, භූ අලංකරණ ක්‍රම වේද පිළිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හරහා පුහුණු කරන ලදී. භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 15 දෙනෙකු ලියාපදිංචි විය. රෝස වගාව, තවාන් කළමනාකරණය, ශාක හඳුනා ගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්, පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව ඉල්ලුම්කරුවන් 2,560 ක් පුහුණු කරන ලදී.

## 5.6 රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

අනුමත ප්‍රතිපාදන :- ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 7.5ක් සහ උද්‍යාන භාර කාර අරමුදල රු.මි. 32.3

වැය :- රු.මි. 33.92



උද්‍යානයේ ආකර්ෂණීය දසුනක්

ශාක සංරක්ෂණය අරමුණු කරගනිමින් මහජනතාවට නැරඹීමේ පහසුකම් සහිත සෙවන ලැදි ශාක සහ දුර්ලභ ශාක ප්‍රදර්ශනය සඳහා පැළ ගෘහයක් ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කර සිදුවෙමින් පවතී.

උද්‍යානයේ දකුණු කොටස සංවර්ධනය කිරීමේ සහ නරඹන්නන්හට නවමු අත්දැකීමක් ලබා දීමේ අරමුණින් දකුණු කොටස ගඟ ආසන්නයේ නැරඹුම් ස්ථානයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.



වනෝද්‍යානයේ පිහිටි වැසිකිළි පද්ධතියෙහි අළුත්වැඩියා කිරීම් කටයුතු

උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ බෝක්කු හා ජලාපවහන පද්ධති වැඩි දියුණු කිරීම සිදුකරන ලද අතර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම මගින් උද්‍යානයට නව පෙනුමක් ද ලබා දීමට කටයුතු කරන ලදී. උද්‍යානයේ නිලධාරීන්ගේ නිල නිවාස ද අලුත්වැඩියා කරන ලදී.

වනෝද්‍යානයේ පිහිටි වැසිකිළි පද්ධතිය නවීකරණය කර අළුත්වැඩියා කරන ලද අතර, උද්‍යානය තුල නරඹනන් සඳහා කෑම ගැනීමේ ඉඩප්‍රස්ථා ඉහළ දැමීමේ අරමුණින් එහි පිහිටි කෑමශාලාව ද නවීකරණය කර අළුත්වැඩියා කරන ලදී. උද්‍යානයේ සංචාරක බංගලාවේ තත්වය උසස් කිරීම සඳහා නවීන උපකරණ සහ ආම්පන්න සවි කරමින් නවීකරණය කර අළුත්වැඩියා කෙරිණි. පැළ අලෙවිසලෙහි වහලය ද අළුත්වැඩියා කෙරිණි.

ප්‍රධාන ගේට්ටුවෙන් උද්‍යානයට නරඹන්නන් ඇතුළු වීමේ දී පවතින තදබදය අඩු කිරීමේ අරමුණින් ගන්නෝරුව පෙදෙසෙහි පිහිටි ටිකට් කවුන්ටරය විවෘත කිරීම පෙරදැරිව එය අළුත්වැඩියා කෙරිණි. එය 2017 වසරේ දී විවෘත කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රධාන උද්‍යානයේ උද්‍යාන භූමි අලංකරණය, නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තුව සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදී ගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

## 5.7 ගම්පහ උද්භිද උද්‍යානය

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 23.4 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 5.5

වැය : රු.මි. 28.05



**බෝට්ටු අංගනය අළුත්වැඩියා කිරීමෙන් පසුව**

උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිලනිවාස, පැළ ගෘහය, උද්‍යානය වටා තාප්පය, ගිම්හාන කුටි, සෙවන ගෘහය, බෝට්ටු අංගනයන් හි අළුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර අළුතින් බෝට්ටු 02ක් උද්‍යානයේ වැවෙහි පැදීම සඳහා යොදවන ලදී. රථගාල ආශ්‍රිත පෙදෙස ඉන්ටලොක් අතුරා පිළිසකර කිරීම් කටයුතු සැලසුම් කර ඇත.

ක්‍රීඩාංගන ආශ්‍රිතව නව වැසිකිළි පද්ධතියක ඉදි කිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර සහ සුභ සාධන ආපනශාලාවක් අළුතින් ඉදිකර නිම කරන ලදී. නව ගිම්හාන කුටියක් ද උද්‍යානයට එක්කරන ලදී. දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස වලට අමතරව අළුතින් නිල නිවාසයක් ඉදිකිරීමට ටෙන්ඩර් ප්‍රදානය කර එහි කටයුතු සිදුවෙමින් පවතී. උද්‍යානයේ ඉඩමට යාබද ව ගලා බසින අත්තනගලු ඔය ඉවුරෙහි අඩි 40ක් සංවර්ධනය සඳහා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ ආයතනයට ටෙන්ඩර් ප්‍රදානය කර එහි කටයුතු සිදුවෙමින් පවතී.

උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නගා සිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රධාන උද්‍යානයේ භූමි අලංකරණය, අඩිපාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තුව සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

## 5.8 හක්ගල උද්භිද උද්‍යානය

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 2.85ක් උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි.8.83

වැය රු.මි. 9.71



ඖෂධ උද්‍යානයේ ඉඩම් සංවර්ධන කටයුතු

උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිලනිවාස, පැළ ගෘහ, ගිම්හාන කුටි, සංචාරක බංගලාවෙහි තීන්ත ආලේප කර අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.

දැනට භාවිතාවන කාර්යාල පරිශ්‍රය පවතින කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බැවින් කාර්යාල පරිශ්‍රයෙ හි විශාල කිරීම් කටයුතු සිදුකිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. දැනට පවතින උද්‍යානයේ ඇතුළුවීමේ ප්‍රවේශ පත්‍ර කවුළුව ඉතා පැරණි එකක් වන අතර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට පැමිණෙන නරඹන්නන් සඳහා ඉඩ පහසුකම් අඩු ස්ථානයකි. එහෙයින් නව ඇතුළුවීමේ සංකීර්ණයක ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇත.



පඳුරු උද්‍යානයේ ඉඩම් සංවර්ධන කටයුතු

උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නගා සිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රධාන උද්‍යානයේ භූමි අලංකරණය, අඩිපාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තුව සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදී ගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

## 5.9. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය

අනුමත ප්‍රතිපාදන: රුපියල් මිලියන 12.5

වැය : රු.මි. 12.34



වන ඖෂධ උද්‍යානයේ දර්ශනයක්

උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන්හි නඩත්තු කටයුතු සිදුකිරීම මගින් උද්‍යානය උසස් තත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.

2014 වසරේ දී ඉදිකිරීම් ආරම්භ කරන ලද ශ්‍රවණාගාරයේ දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු සිදුකිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇත.

ප්‍රදේශයේ මල්වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් ඇන්තූරියම් හා ඕකිඩ් වගා අංශ ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 25,000 කට අධික ප්‍රමාණයක් නිපදවන ලදී. ශාක එකතුව වැඩි දියුණු කිරීම සඳහා හීං අරත්ත (*Alpinia calcarata*), සුදු හඳුන් (*Santalum album*), සහ නියඟලා (*Gloriosa*) ශාක වගා කරන ලදී. දුර්ලභ ඖෂධ ශාක පැල 40ක් උද්‍යානයට අලුතින් එක්කරන ලදී.

ප්‍රධාන උද්‍යානයේ භූමි අලංකරණය, අඩිපාරවල්, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තුව සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

### 5.10. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

| |
|---|
| අනුමත ප්‍රතිපාදන:- රුපියල් මිලියන 7 |
| වැය :-රුපියල් මිලියන 6.99 |

ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල අංක. 04 හි අළුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා වයඹ ඉංජිනේරු කාර්යාලයට ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රය අලංකාර කිරීම සඳහා භූමි සංවර්ධන කටයුතු සිදුකර ඇත. ඇන්තූරියම් සහ ඕකිඩ් පැළ තවාන් හි පැළ තවාන් කටයුතු ද සිදුකරන ලදී.

## 6. දෙපාර්තමේන්තුව යටතේ සෙසු ඒකකවල කළමනාකරණය

### 6.1. අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01 හි පිහිටි ජනාධිපති මන්දිරය, මහනුවර, නුවරඑළිය, අනුරාධපුර මන්දිර, ගරු අගමැතිතුමාගේ කොළඹ අරලියගහ මන්දිරය සහ නුවරඑළියේ පිහිටි නිළ නිවාසබද උද්‍යාන උසස් ලෙස නඩත්තු කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාසබද උද්‍යානවල අලංකරණය සහ සැලසුම් කල පරිදි තත්වය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන කටයුතු දියත් කර ඇත.



**ශ්‍රී මහා බෝධීන්වහන්සේගේ සෞඛ්‍ය තත්වය සොයා බලමින්**

### 6.2 අනුරාධපුර ශ්‍රී මහා බෝධිය

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්වය සොයා බැලීමේ කටයුතු සඳහා පියවර ගැනීම මෙන්ම බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්වය පවත්වාගෙන යාමේ කටයුතු සඳහා මෙම වසරේදී පියවර ගන්නා ලදී. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට පරිවාර බෝධීන් වහන්සේලා ලෙස බෝ පැළ 31 ක් රෝපණය කරන ලදී.

## 6.3. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක

මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලය යන ස්ථානයන් හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක වල නඩත්තු කටයුතු හා කළමනාකරණ කටයුතු ඉහළ මට්ටමක පවත්වාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු සිදුකරන ලදී.



ජාවත්ත හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන

## 6.4. උද්භිද උද්‍යාන භාර අරමුදල

උද්භිද උද්‍යාන සංවර්ධනය සහ සුහසාධනය සඳහා වූ උද්භිද උද්‍යාන භාර අරමුදල 1996 පෙබරවාරි 07 දින කැබිනට් අනුමැතියෙන් ආරම්භ කරන ලද්දේ 1995 දෙසැම්බර් 15 වැනි දින කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් ඇමති වෙත ඉදිරිපත් කරන ලද කැබිනට් සටහන් පත්‍රිකාව සැලකිල්ලට ගනිමිනි.

උද්භිද උද්‍යානවල වාර්ෂික ආදායමෙන් 25% උද්භිද උද්‍යානය වැඩිදියුණු කිරීම සහ එහි සුහසාධනය සඳහා උද්‍යාන භාරකාර අරමුදල වෙත වෙන් කිරීමක් වන අතර මෙය මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සඳහා මුල්‍යමය ආධාර සැපයීම මෙම අරමුදලේ ප්‍රධාන අරමුණ වන අතර අනෙකුත් අරමුණු පහත පරිදි වේ.

- උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල ද ප්‍රවර්ධනය
- වැදගත්කමින් යුත් අධ්‍යාපන වැඩසටහන් සහ පැළෑටි සංරක්ෂණය කිරීම, ක්‍රියාත්මක කිරීම
- පහසුකම් වැඩිදියුණු කිරීම සහ උපකරණ මිළදී ගැනිම සඳහා මුල්‍යමය ආධාර සැපයිම
- ශාක එකතුව පිළිබඳ ක්‍රමවත් දැන්වීම
- උද්භිද උද්‍යානවල සංවර්ධනය මෙන්ම තාක්ෂණික, අධ්‍යාපනික සහ පුහුණු ක්‍රියාදාමයන් වැඩිදියුණු කිරීම සඳහා මුල්‍යමය ආධාර සැපයීම
- උද්භිද උද්‍යානයට පැමිණෙන විද්‍යාඥයින් සහ විශේෂ නියෝජිතයින් සඳහා පහසුකම් සැපයීම සඳහා කඩිනම් ගොඩනැංවීම් භාර ගැනීම
- දෙන ලද විශේෂ වූ වැඩසටහනකට අවශ්‍ය පුනරාවර්තන වැය ආවරණය කිරීම

උද්‍යානභාර අරමුදලේ මුල්‍යමය සහාය යටතේ 2015 වර්ෂයේදී උද්‍යානවල සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලද අතර උද්‍යානවල තත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට විශාල දායකත්වයක් සපයන ලදී .

2015 වර්ෂය සඳහා උද්‍යාන භාර අරමුදලේ වාර්ෂික ප්‍රාග්ධන වෙන්කිරිම් රුපියල් මිලියන 100 ක් වූ අතර උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහා එයින් රුපියල් මිලියන 88.6 (89%) භාවිතා කර ඇත.

## 7. 2015 වර්ෂය තුල සිදු කරන ලද අභ්‍යන්තර ස්ථාන මාරු, වැටුප් වර්ධක, හා වෙනත් කටයුතු

### 7.1 බඳවා ගැනීම් - ගැසට් නිවේදන මගින්

| තනතුර | පැවති පුරප්පාඩු ගණන | ලැබුනු අයදුම්පත් ගණන | බඳවාගත් ප්‍රමාණය |
|---|---|---|---|
| උද්‍යාන වැඩ මූලික | 10 | 675 | 08 |
| බංගලා භාරකරු | 02 | 225 | 02 |
| සහාය බංගලා භාරකරු | 04 | 130 | * |
| ලොරි පවිත්‍රකරු | 02 | 19 | * |
| පෙදරේරු | 02 | 03 | * |
| බද්ධකරු | 03 | 17 | 02 |
| මෝටර් කාර්මික | 01 | 28 | 01 |
| විදුලි කාර්මික | 02 | 77 | 02 |
| වඩුකරු | 04 | 18 | 03 |
| ලේබල්කරු | 02 | 25 | 03 |
| **එකතුව** | **32** | **1217** | **21** |

*බඳවා ගැනීම් 2016 වර්ෂයේ සිදුකරනු ඇත.

### 7.2. 2015 වර්ෂය තුල විශ්‍රාම ගැනීම්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| කෘෂි උපදේශක | 01 |
| කළමනාකරණ සහකාර | 02 |
| කම්කරු | 04 |
| **එකතුව** | **08** |

### 7.3. ස්ථානමාරු -2015 වර්ෂය තුල

| තනතුර | දෙපාර්තමේන්තුවෙන් පිටතට ගිය ගණන | දෙපාර්තමේන්තුවට පැමිණි ගණන |
|---|---|---|
| කළමනාකරණ සහකාර සේවය | 02 | 05 |
| කාර්යාල සේවක සේවය | 02 | 05 |
| රියදුරු | 01 | 02 |
| **එකතුව** | **05** | **12** |

## 8. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම

### 8.1. කාර්ය මණ්ඩල දෙපාර්තමේන්තුමය පුහුණු වැඩසටහන්

| අංකය | වැඩසටහන | දිනය | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|
| 1. | 2015 වසරේ PL-2 නව බඳවාගැනීම් සඳහා සේවාරම්භක පුහුණුව | 2015.05.21/ 22 | PL-2 සේවා ගණයේ බංගලා භාරකරු, පෙදරේරු, මෝටර් කාර්මික, විදුලි කාර්මික, බද්ධකරු, වඩුකරු හා ලේබල්කරු යන තනතුරු |
| 2. | විනය කාර්ය පරිපාටිය හා මු.රෙ. 104 පරීක්ෂණ | 2015.06.11/12 | ඒකක ප්‍රධානීන්, මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සියළු ඒකක ඇතුලත් කාර්යාල කාර්ය මණ්ඩලය |
| 3. | ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ සතිය නිමිත්තෙන් වූ වැඩසටහන | 2015.07.22 | සියලු කාර්ය මණ්ඩලය |
| 4. | වැඩමූලික නිලධාරීන් සඳහා වන වැඩමුළුව | 2015.12.07/08 | වැඩමූලික නිලධාරීන් |
| 5. | සේවාස්ථ පුහුණු වැඩමුළුව | 2015.12. 21 | සියලු නිලධාරීන් |

### 8.2. කාර්ය මණ්ඩල නිලධාරීන් බාහිර ආයතන වෙතින් ලද පුහුණු

| අංකය | වැඩසටහන | දිනය | සහභාගි වූ ගණන | සේවා ගණය |
|---|---|---|---|---|
| 1. | ප්‍රවාහන කළමනාකරණය | 2015.01.30 | 01 | කළමනාකරණ සහකාර |
| 2. | අභ්‍යන්තර විගණනය | 2015.04.23/24 | 01 | සංවර්ධන නිලධාරි |
| 3. | හානි, පාඩු හා පොතෙන් කපා හැරීම් | 2015.05.11/12 | 01 | එම- |
| 4. | ධනාත්මක ආකල්ප හා හැකියා වර්ධනය | 2015.05.29 | 01 | කළමනාකරණ සහකාර |
| 5. | ගිණුම් ලිපිකරුවකු සතු කාර්යභාරය හා වගකීම | 2015.09.28/29 | 04 | කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරි |
| 6. | රාජ්‍ය ආයතනවල විගණන | 2015.10.01/02 | 03 | කළමනාකරණ |

| | | | | |
|---|---|---|---|---|
| | ගැටළු අවම කරගන්නේ කෙසේද. | | | සහකාර, සංවර්ධන නිලධාරි |
| 7. | ධනාත්මක ආකල්ප හා පුද්ගල අභිප්‍රේරණය | 2015.10.06 | 01 | කළමනාකරණ සහකාර |
| 8. | බඳවාගැනීම් පරිපාටි | | 01 | කළමනාකරණ සහකාර |
| 9. | ප්‍රසම්පාදන සැලසුම් සැකසීම | 2015.10.13 | 03 | කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරි |

## 9. 2016 වර්ෂය සඳහා අනාගත සැලැස්ම

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | ඒකාබද්ධ අරමුදලින් | උද්භිද උද්‍යාන භාර අරමුදලින් |
| **පවතින උද්භිද උද්‍යාන හා අනෙකුත් වැඩසටහන් කළමනාකරණය** | | |
| **මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය** | | |
| කැක්ටස් ගෘහය, පැළ ගෘහය, කාර්ය මණ්ඩලය උපයෝගිතා ගොඩනැගිල්ල ස්ථාපිතකර නිමකිරීම | 15 | 0 |
| මල්වගා පරීක්ෂණාගාරය ඉදිකිරීම | 8 | 0 |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 5 | 0 |
| උද්‍යානයට වැඩි සංචාරකයින් ප්‍රමාණයක් ආකර්ෂණය සඳහා නව ප්‍රවේශ මාර්ගයක් ඉදි කිරීම | 8 | 0 |
| නිල නිවාස 02ක් ඉදිකිරීම | 11 | 0 |
| ආපන ශාලාවක් ඉදි කිරීම | 5 | 0 |
| උද්‍යානයේ ආරක්ෂිත වැට ඉදිකර නිම කිරීම | 5 | 0 |
| ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු | 4 | 0 |
| කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 1 | 0 |
| යන්ත්‍රෝපකරණ හා නව ආම්පන්න මිලදී ගැනීම | 21.5 | 0 |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 10 | 0 |
| සියලුම ශාක නාම ලේබල් කිරීම, විශේෂ ශාක පිලිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 2 | 0 |
| සංචාරකයින් සඳහා උද්‍යානය පිළිබඳ දැනුවත් කිරීමේ/මග පෙන්වීමේ (guided tours) වැඩසටහන්, පාසල් ළමුන් ඇතුළු මහජනතාවට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 3 | 0 |
| **අවශ්‍ය මුළු ප්‍රතිපාදන** | **98.5** | **0.00** |
| **ඉලුක්ඔිවිට තෙත් කලාපීය උද්භිද උද්‍යානය** | | |
| නැරඹුම් ස්ථානයක් ඉදිකිරීමේ කටයුතු නිම කිරීම | 1 | 0 |
| බොන්සායි ගෘහයක් ඉදිකිරීම | 5 | 0 |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | ඒකාබද්ධ අරමුදලින් | උද්භිද උද්‍යාන භාර අරමුදලින් |
| ගිම්හාන නිවාස 02ක් ස්ථාපිත කිරීම | 2 | 0 |
| පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීම | 2 | 0 |
| ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු | 0.85 | 0 |
| නව ආම්පන්න මිලදී ගැනීම | 1.3 | 0 |
| කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 0.3 | 0 |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම හා ශාකාගාරයක් ඉදිකිරීම | 2 | 0 |
| සියලුම ශාක නාම ලේබල් කිරීම, විශේෂ ශාක පිළිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 1 | 0 |
| සංචාරකයින් සඳහා උද්‍යානය පිළිබඳ දැනුවත් කිරීමේ/මග පෙන්වීමේ (guided tours) වැඩසටහන්, පාසල් ළමුන් ඇතුළු මහජනතාවට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | 1 | 0 |
| ආපනශාලාවක් ඉදි කිරීම | 2.55 | 0 |
| පැළ අලෙවිසලක් ඉදිකිරීම | 2 | 0 |
| උද්‍යානයේ ආරක්ෂිත වැට ඉදිකර නිම කිරීම | 2 | 0 |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 2 | 0 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **25** | **0.00** |
| **ගම්පහ උද්භිද උද්‍යානය** | | |
| ඕකිඩ් නිවාසය ස්ථාපිතකර නිම කිරීම සහ එහි බොන්සායි කොටසක් ඉදිකිරීම | 0 | 9 |
| ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු | 0.5 | 0 |
| නව ආම්පන්න මිලදී ගැනීම | 1 | 0 |
| කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 0.3 | 0 |
| නව වැසිකිළි 02ක් ස්ථාපිත කිරීම | 0 | 2 |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම | 1 | 0 |
| සංචාරකයින් සඳහා උද්‍යානය පිළිබඳ දැනුවත් කිරීමේ/මග පෙන්වීමේ (guided tours) වැඩසටහන්, පාසල් ළමුන් ඇතුළු මහජනතාවට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 1 | 0 |
| සියළුම ශාක නාම ලේබල් කිරීම, විශේෂ ශාක පිළිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 1 | 0 |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 2 | 0 |
| නිලනිවාස 02ක් ඉදිකිරීම | 6 | 0 |
| නරඹන්නන් සඳහා පානීය ජල කරාම හා බංකු ස්ථාපිත කිරීම | 0.5 | 0 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **13.3** | **11** |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | ඒකාබද්ධ අරමුදලින් | උද්භිද උද්‍යාන භාර අරමුදලින් |
| **ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය** | | |
| ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු | 1 | 0 |
| නව ආම්පන්න හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 1.4 | 0 |
| ඖෂධ ශාක පිළිබඳ අත් පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම | 0 | 0.5 |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම | 2 | 0 |
| සංචාරකයින් සඳහා උද්‍යානය පිළිබඳ දැනුවත් කිරීමේ/මග පෙන්වීමේ (guided tours) වැඩසටහන්, පාසල් ළමුන් ඇතුළු මහජනතාවට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 0 | 1 |
| සියළුම ශාක නාම ලේබල් කිරීම, විශේෂ ශාක පිළිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 0.6 | 0 |
| ගිම්හාන නිවාස 02ක් ස්ථාපිත කිරීම (40'*30') | 0 | 2 |
| පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීම | 2 | 0 |
| දේශීය ඖෂධීය ගුණයන්ගෙන් යුත් ආහාර පාන සහිත වෙළඳසැලක් ඉදිකිරීම | 4 | 0 |
| ශාකාගාර කටයුතු සංවර්ධනය | 0.2 | 0 |
| ඉඩම් සංවර්ධනය හා ඖෂධ වගාව පුළුල් කිරීම | 2 | 0 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **13.2** | **3.5** |
| **හක්ගල උද්භිද උද්‍යානය** | | |
| පිවිසුම් ප්‍රදේශය ප්‍රතිව්‍යුහගත කිරීම් කටයුතු, කාර්යාලීය ප්‍රදේශයේ නවීකරණ කටයුතු නිම කිරීම | 0 | 15 |
| ආපනශාලාවක් ඉදිකිරීම | 0 | 5 |
| වැසිකිළි සහිත ගිම්හාන නිවාස 02ක් ස්ථාපිත කිරීම (40'*30') | 1.5 | 2.5 |
| ගොඩනැගිලි, නිලනිවාස, වාහන හා ආම්පන්න අළුත්වැඩියා කටයුතු | 1.5 | 0 |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 0.6 | 0 |
| නිලනිවාස ඉදිකිරීම | 0 | 4 |
| අභ්‍යාන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 0 | 2.5 |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම , ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම | 0 | 1 |
| සංචාරකයින් සඳහා උද්‍යානය පිළිබඳ දැනුවත් කිරීමේ/මග පෙන්වීමේ (guided tours) වැඩසටහන්, පාසල් ළමුන් ඇතුළු මහජනතාවට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 0 | 2 |
| සියළුම ශාක නාම ලේබල් කිරීම, විශේෂ ශාක පිළිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 0 | 1 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **3.6** | **33** |
| **පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය** | | |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | ඒකාබද්ධ අරමුදලින් | උද්භිද උද්‍යාන භාර අරමුදලින් |
| පැළ ගෘහය ස්ථාපිතකර නිමකර එහි බොන්සායි කොටසක් ඉදිකිරීම | 0 | 3 |
| දකුණු කොටස ගඟ ආසන්නයේ නැරඹුම් ස්ථානයක් ස්ථාපිත කිරීම් නිමකිරීම | 0 | 2 |
| නරඹන්නන් සඳහා පානීය ජල කරාම හා බංකු ස්ථාපිත කිරීම | 0 | 1 |
| සංචාරකයින් භාවිතාකරන භෝජනාගාරයේ අළුත්වැඩියා කටයුතු - පළමු අදියර | 0 | 2 |
| සංචාරක බංගලාව ප්‍රතිව්‍යුහගත කිරීම - පළමු අදියර | 1 | 0 |
| ගොඩනැගිලි, නිලනිවාස, ආම්පන්න හා කාර්යාලීය උපකරණ අළුත්වැඩියා කටයුතු | 2.6 | 0 |
| නව ආම්පන්න හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 0.4 | 0 |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම | 0 | 7 |
| නිලනිවාස 01 ක් ඉදිකිරීම | 0 | 05 |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරිම , ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම | 0 | 2 |
| සංචාරකයින් සඳහා උද්‍යානය පිළිබඳ දැනුවත් කිරීමේ/මග පෙන්වීමේ (guided tours) වැඩසටහන්, පාසල් ළමුන් ඇතුළු මහජනතාවට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 0 | 1 |
| සියළුම ශාක නාම ලේබල් කිරීම, විශේෂ ශාක, දැකියහැකි සතුන්, විශේෂ ස්ථාන පිළිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 0 | 1 |
| කාර්ය මණ්ඩල සඳහා විදේශීය පුහුණු අවස්ථා ලබා දීම | 0 | 5 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **4** | **29** |
| **අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය** | | |
| භූ අලංකරණ ක්‍රම වේද පිළිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම | 0 | 0.5 |
| භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම | 0 | 0.5 |
| පුහුණු වැඩසටහන් | 0.2 | 0 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **0.2** | **1** |
| **මල් වගා සංවර්ධනය** | | |
| පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් | 0 | 6 |
| මල්වගාව සම්බන්ධව අත් පත්‍රිකා, පුවත් පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම | 0 | 1 |
| වගා කරුවන්ගේ හැකියාව ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් සහ මල් ප්‍රදර්ශන සංවිධානය කිරීම | 0 | 1 |
| රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා මව් ශාක මිලදී ගැනීම. | 0 | 3 |
| රැස්වීම් වලට සහභාගී වීම සහ පැළ තවාන් කළමණාකරණය සඳහා පැළ තවාන් වල සංචාරය සහ උපදෙස් සැපයීම සහ වගා කරුවන් සඳහා සෙසු සහාය ලබාදීම | 0 | 5 |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | ඒකාබද්ධ අරමුදලින් | උද්භිද උද්‍යාන භාර අරමුදලින් |
| ද්‍රව්‍ය සැපයීම මගින් වගා කරුවන්ට සහාය ලබා දීම | 0 | 6 |
| පැළ තවාන් සහ වැවිලි ප්‍රදේශ දියුණු කිරීම | 0 | 3 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **0.00** | **25** |
| **ජාතික ශාකාගාරය** | | |
| පර්යේෂණ ක්‍රියාකාරකම්, ශාක ගවේශණ කටයුතු සිදු කිරීම | 0 | 1 |
| ශාක සංරක්ෂණය, ආවේනික ශාක, වඳවීමේ තර්ජනයට ලක් වූ ශාක , ජෛවවිවිධත්වය, ජෛවවිවිධත්ව සංරක්ෂණය ආදී අදාල ක්ෂේත්‍රයන් පිළිබඳ අත් පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම | 0 | 1 |
| ජාතික ශාකාගාරයේ නවීකරණ කටයුතු | 0 | 4 |
| **අවශ්‍ය මුළු ප්‍රතිපාදන** | **0.00** | **6** |
| **මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය** | | |
| භූමියේ ඇති පැරණි ගොඩනැගිලි අළුත්වැඩියාව | 3 | 0 |
| නව ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 1 | 0 |
| පැළ තවාන් සහ වැවිලි ප්‍රදේශ දියුණු කිරීම | 1 | 0 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **5** | **0.00** |
| **නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලය** | | |
| මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ තොරතුරු කොළඹ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම හා මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ උපදේශනය සඳහා ක්ෂණික ඇමතුම් අංකයක් ස්ථාපිතකිරීම | 0 | 1.5 |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **0.00** | **1.5** |
| ඩෙල්ෆ් දූපතේ උද්භිද විද්‍යා පර්යේෂණ හා අධ්‍යාපන කටයුතු ස්ථාපිත කිරීම | **0** | **10** |
| **ප්‍රධාන කාර්යාලය** | | |
| ප්‍රධාන කාර්යාලයේ පහසුකම් වැඩිදියුණු කිරීම | **0** | **5** |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **162.8** | **125** |
| **නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | |
| ශ්‍රී පාද අඩවි ප්‍රදේශයේ නව උද්භිද උද්‍යානයක් ස්ථාපිතකිරීම | 20 | 0 |
| උතුරු, නැගෙනහිර පළාත් වල මල් වගා සංවර්ධන සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් | 15 | 0 |
| උතුරු පළාතේ නව උද්භිද උද්‍යානයක් ස්ථාපිතකිරීම | 10 | 0 |
| රාජකීය උද්භිද උද්‍යානයේ නේවාසිකාගාරයක් ඉදිකිරීම | 0 | 15 |
| රාජකීය උද්භිද උද්‍යානයට නව රථ ගාලක් ස්ථාපිතකිරීම | 50 | 0 |
| රාජකීය උද්භිද උද්‍යානයේ පිහිටි ලක්සල ආයතනය පවත්වාගෙන යන ගොඩනැගිල්ල තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා පවරා ගැනීම. | 0 | 2 |
| ජාතික ශාකාගාරය සඳහා නව අංශයක් එක් කිරීම | 0 | 15 |
| ඩෙල්ෆ් දූපතේ උද්භිද විද්‍යා පර්යේෂණ හා අධ්‍යාපන කටයුතු | 0 | 10 |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | ඒකාබද්ධ අරමුදලින් | උද්භිද උද්‍යාන භාර අරමුදලින් |
| ස්ථාපිත කිරීම | | |
| ද අල්විස් මහතාගේ උද්භිද විද්‍යාත්මක චිත්‍ර ආශ්‍රයෙන් ප්‍රකාශනයක් සෑදීම | 0 | 4 |
| රාජකීය උද්භිද උද්‍යානයේ එල්ලෙන පාලම පිළිසකර කිරීම | 0 | 10 |
| **නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මුලු වියදම** | **95** | **56** |